ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2469/36 - 2026 ජනවාරි මස 04 වැනි ඉරිදා - 2026.01.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

ශ්‍රී ලංකා මහ බැංකු නිවේදන

නේෂන් ලංකා ෆිනෑන්ස් පීඑල්සී ආයතනයට පත් කරන ලද අද්මිනිස්ත්‍රාසිකරුගේ ධුර කාලය, 2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනතේ 18 වන වගන්තිය යටතේ දීර්ඝ කිරීම

2025.07.04. සිට බලාත්මක වන 2025.07.04 දිනැති අංක 2443/57 දරන *අති විශෙෂ ගැසට් නිවේදනයේ* පළ කරන ලද නියමය අනුව, නේෂන් ලංකා ෆිනෑන්ස් පීඑල්සී ආයතනයේ අද්මිනිස්ත්‍රාසිකරු ලෙස පත් කරන ලද පී.ඩබ්.ඩී.එන්.ආර්. රොද්‍රිගෝ මහතාගේ ධුර කාලය මෙතැන් සිට, 2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනතේ 19 වන වගන්තිය සමග කියවනු ලබන 18 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පැවරී ඇති බලතල අනුව, 2026.01.04 දින සිට ආරම්භ වී 2026.07.03 දින අවසන් වන පරිදි මාස හයක (06) කාලයක් දක්වා තවදුරටත් දීර්ඝ කර ඇත.

අද්මිනිස්ත්‍රාසිකරුගේ පරිපාලනමය සහ ව්‍යවස්ථාපිත වගකීම් අඛණ්ඩ ව පවත්වා ගෙන යාමට සහ 2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනතේ නීතිවලට අනුකූල ව නේෂන් ලංකා ෆිනෑන්ස් පීඑල්සී ආයතනය සම්බන්ධයෙන් සුදුසු නිරාකරණ ක්‍රියාමාර්ගයක් අනුගමනය කිරීමට හැකි වන පරිදි ධුර කාලය මෙලෙස දීර්ඝ කිරීම සිදු කර ඇත.

ආචාර්ය පී. නන්දලාල් වීරසිංහ,
පාලක මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති.

EOG 12 - 0228

1A - G 45975 — 23 (2025/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*